## ඇත්ත කෙටි කතාව

# තුතන්කාමන් නොදැන සිටි ලංකා ක්‍රමවේදය



**ඒ** දැනට අවුරුදු දහයකට පමණ පෙර අගෝස්තු නිවාඩුවයි. මිසරයේ පිරමිඩ් දැකගන්නට කලක් තිස්සේ බොහෝ ආශාවෙන් සිටි මාත්, බිරින්දැත්, දියණි යන් දෙදෙනාත් වසර තුන් දහසකටත් වඩා පැරණි නටබුන් අතර දින දහයක සංචාරයකට මුල පුරමිනි. එහිදී අත්දුටු දේ අතර තවමත් මගේ මතකයෙන් බැහැර කළ නොහැකි සිද්ධීන් කීපයක් වෙයි. තුතන්කාමන් **Tutankhamun** නමැති තරුණ රජතුමාගේ සොහොන් ගැබ නැරඹීමට යෑම සහ එහි පින්තූර ගැනීම ඉන් එකකි.

**Valley of kings** හෙවත් ආදි මිසර රජවරුන් වළලා දමා ඔවුන්ගේ සොහොන් ගැබ් සාදවා ඇති නිම්නයේ ඒවායින් පිරී ගොස් ඇත. එහෙත් ඒ අතර විශේෂිත රජවරුන් සිටින්නේ කීප දෙනෙකුන් පමණි. ඔවුන් අතරින් තුතන්කාමන් ප්‍රධාන තැනක් ගනී. එයට හේතු කීපයක් ඇත. පළමුවැන්න, වසර තුන්දහසක් තිස්සේ එම සොහොන් ගැබ නිදන් වස්තු මංකොල්ල කරුවන්ගෙන් ආරක්ෂාවී තිබීමයි. දෙවැන්න, මෙම රජු වයස දහ අටක් වන විට රජවී, මරණයට ද පත්ව තිබීමයි. ක්‍රිස්තු පූර්ව 1333 සිට 1324 දක්වා වසර නවයක් රජකළ හෙතෙමේ හිසට වැදුණු තද පහරකින් පරලොව ගොස් තිබුණි.

1922 දී හොවාර්ඩ් කාටර් නමැති පුරා බ්‍රිතාන්‍ය පුරා විද්‍යාඥයා සහ ඔහුට මුදල් යෙදවූ කානන් සාමිවරයා සොහොන් ගැබ සොයාගන්නා තුරු එය, ඒ තුළ අධික වටිනාකමින් යුත් රත්තරන් සහ අනෙකුත් භාණ්ඩ සමග නිරුපද්‍රිතව තිබුණේය. මෙම සොයාගැනීමත් සමග ඊජිප්තුවේ කැණීම් පිළිබඳව විශාල උනන්දුවක් ඇතිවෙන්නට පටන් ගැනුණි. මෙම සොහොන් ගැබ ඉදිකළ මුල් කාලයේම සොරුන් එය බිඳ යම් දේවල් අරගෙන තිබුණත් 1920දී එය සොයා ගැන්මට පෙර වසර තුන්දහසකටත් වඩා ආරක්ෂා වී තිබුණ බව සනාථවී තිබේ. ඒ කෙසේ වෙතත් සොහොන් ගැබ විවෘත කළාට පසු එයට මුදල් යෙදූ සාමිවරයා ඇතුළු කීප දෙනෙකු කාරණා රහිතව මරණයට පත්වූ බව ද සඳහන්ව ඇත.



*සොහොන් ගැබේ තනි රනින් නිමකළ තුතන්කාමන් රජුගේ මුහුණේ පිළිරුව*

මා මේ කියන්නට යන්නේ එම සොහොන් ගැබේ පින්තූර ගත් ආකාරයයි. අනෙක් සොහොන් ගැබ්වල මෙන් නොව මෙම තුතන්කාමන් ගර්භයේ මුරකාරයෙක් රැකවල් ලා සිටියේය. කිසිවෙකුට කැමරා හා විඩියෝ කැමරා එය තුළට ගෙනයාමට අවසර නැති බව මෙන්ම, එහි පින්තූර ගැන්ම සපුරා තහනම් බව දැක්වෙන දැන්වීම් අලවා තිබුණි. මුරකරුද එක්වරම අප අත තිබූ කැමරා දැක ඒවා එතැන වූ අට්ටාල යක තබා ඇතුළට යා යුතු බව දැන්වීය.

ඒ කියූ ලෙස කැමරා ආම්පන්න එහි තබා එම ගර්භයට පිවිසි අපි එහි අලංකාරය නැරඹූයෙමු. සැබැවින්ම තිබුණු විචිත්‍ර සිත්තම් සහ අගනා ගෘහ භාණ්ඩ මෙන්ම රත්තරනින් කෙරුණු නොයෙක් ආභරණ සහ විශේෂයෙන් තුතන්කාමන්ගේ ඝන රන් මුහුණක් ද තිබුණු අතර ඒවා සැබැවින්ම ඇස් ගණනාවකින් බැලිය යුතු තරමේ තැනක් වූයේ ය. ඒ තුළ ඡායාරූප ගැන්ම තහනම් වූයේ ඒවා මත එක්තරා පුස් වර්ගයක් බිහිව තිබීමත්, කැමරාවේ ක්ෂණික ආලෝක ධාරාවෙන් ඒ සිතුවම් සහ භාණ්ඩවලට හානි සිදුවීම වැළැක්වීමටත්ය යන්න දැන්වීම් මගින් පවසා තිබිණ.

එහෙත් සොහොන් ගැබ අභ්‍යන්තරයේ ඡායාරූපයක් නොගෙන ආපසු යන්නට මගේ හිත ඉඩ දුන්නේ නැත. කිසිවෙකු ළඟ පාත නැතිවන තුරු සිට මුරකරුට කිට්ටු වූ මම මගේ දියණියගේ ආසාවට සොහොන් ගැබේ එක පින්තූරයක් ගන්නදැයි ඇසුවෙමි. ඒ වචන ඇසෙත්ම මා වෙත කඩා පැන් ඔහු, " නෑ... නෑ... අපෝ බෑ..." යයි ස්ථිරවම කියා සිටියේය. මම ඩොලර් දහයේ නෝට්ටුවක් සාක්කුවෙන් ගෙන ඔහු වෙත දික් කළෙමි. එසැණින් ඔහු මුහුණට සිනාවක් නැගිණ. **Fifty** (පණහයි) ඔහු කීවේය. **Twenty** (විස්සයි) කී මම තව ඩොලර් දහයේ නෝට්ටුවක් සාක්කුවෙන් ගතිමි. මගේ කැමරාව ද, ඩොලර් විස්ස ද අතින් ගත් ඔහු මටත් මගේ දියණියටත් පහළට එන ලෙස අතින් සංඥා කරමින් පහළට බැසගෙන ගියේ ය. (මේ වන විට මගේ වැඩිමහල් දියණියත්, බිරිඳත් වාහනයට ගොස් සිටියහ.)

ශබ්ද නොකරන ලෙස ඇඟිල්ලෙන් දෙතොල තද කරමින් ඉදිරියට ගිය ඔහු අලංකාර බිතු සිතුවම් පසුතලයට තබා අප දෙදෙනාගේ පින්තූර කීපයක් ගත්තේය. අනතුරුව කැමරාව මා අතට දී ඉක්මනින් තව පින්තූර කීපයක් ගෙන උඩට එන ලෙස කියා උඩට දුවගෙන ගියේය. තව පින්තූර කීපයක් ගත් අපි ඉක්මනින් උඩට ආවෙමු. වාසනාවට ඒ වන තුරු තව නරඹන්නන් පැමිණ තිබුණේ නැත.

ශ්‍රීලාංකික පුහුණුව යටතේ ඉගෙන ගත් ක්‍රමවේදයක් කලකට පසුව ප්‍රායෝගිකව යෙදූ ආකාරයයි ඒ. නරක නෑ නේද?

♦ ***නීතිඥ අනුර හෑගොඩ***
**London**

## හෘදරෝගී ලාංකික දරුවන් බේරාගැන්මේ පුරෝගාමියා අවසන් ගමන් ගියේය!

# සානුකම්පික හිතක් තිබූ ජායි!



**ජායි ලමීර් මහතා**
**Mr Jai Lameer**

**වි**දේශගතව සිටියත් තමා උපන් මාතෘ භූමිය ශ්‍රීලංකාවට විශාල මෙහෙවරක් ඉටුකළ අතිශය කාරුණික හදවතක් හදිසියේම නැවතුණු පුවත ඇසූ ලන්ඩනයේ බොහෝ දෙනෙක් තවම කම්පා වෙති. ශ්‍රීලංකාවට **මර්සි මිෂන්** හෙවත් **සානුකම්පික මෙහෙවර** එක්සත් රාජධානියේ සිට ගෙනයන්නට පුරෝගාමීවූ අල්හාජ් ජායි ලමීර් මහතාගේ අවමඟුල ජනවාරි **11** දින සරේ ප්‍රාන්තයේ ක්‍රොයිඩන්හිදී සිදුවිය.

ලන්ඩනයේ සුප්‍රකට ළමා රෝහලක් වන ගයිස් තොම්ප්සන් රෝහලේ සේවයේ නියුක්ත විශේෂඥ වෛද්‍යවරුන් හා හෙද හෙදියන්ගෙන් යුත් කණ්ඩායමක් වසරකට වරක් ශ්‍රීලංකාවට ගොස් එහි හෘද රෝගී ළමයින් සොයා ඔවුන් නොමිළයේ සුවපත් කිරීමේ කාර්යයක යෙදී සිටිති. එය හඳුන්වා ඇත්තේ **Mercy Mission** හෙවත් සානුකම්පික මෙහෙවර නමිනි. **2002** සිට මේ වෛද්‍ය කණ්ඩායම හත්වරක් ශ්‍රීලංකාවට ගොස් ගාල්ලේ කරාපිටිය රෝහලේදී සාර්ථක සැත්කම් මගින් ලාංකික දරුවන් විශාල සංඛ්‍යාවක් සුවපත්කර ඇත..

මෙම උතුම් කටයුත්තට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන හා පහසුකම් සංවිධානය කරමින්, සපයමින් මූලික අත්වැල වූයේ ජායි ලමීර් මහතාය. ඔහු නොවන්නට එවැන්නක් කිසිදාක සිදු නොවේ.

මෙම මානුෂික සත්කාරයට හේතුව වූයේ ජායි ලමීර්ද 2000 වසරේ ලන්ඩනයේදී බයි පාස් සැත්කමකට භාජනය වීමයි. ඔහුට ප්‍රතිකාර කළ වෛද්‍ය විශේෂඥයා සමග මිත්‍ර වූ ජායි, ශ්‍රීලංකාවේ හෘදයාබාධ වලින් පෙළෙන ළමයින් ගැනද, එහි වෛද්‍ය පහසුකම් අඩුකම ගැනද විස්තර කළේය. ඒ කරුණු නිසාම එම වෛද්‍යවරයා ඇතුළු වෛද්‍ය පිරිසක්ම ශ්‍රී ලංකාවට ගොස් නොමිළයේ ප්‍රතිකාර කරන්නට කැමති වූහ. කාර්යය සාර්ථක විය.

ජායිගේ අකල් වියෝගයෙන් ඔහුගේ ආදරණීය බිරිඳ ජයන්ති ද, දුව හා පුතාද, මුනුබුරු මිනිබිරියන්ද පමණක් නොව, ලන්ඩනයේ ඔහු ගැන දන්නා සියලු හිත මිතුරෝ අතිශයින් දුක් වෙති. සැබැවින්ම ඔහු උපන් රට ගැන නිතර සිතූ, ඒ වෙනුවෙන් විශාලතම මෙහෙවරක් ඉටු කළ අවංක ලංකා පුත්‍රයෙකි.

ජායි ලමීර් මහතාට නිවන් සැප ලැබේවා !

♦ ***දයා***



## ඔටුවා සුරතල් සතෙකි !



**ල**ංකාව ගැන ලෝකෙ සිද්ධවෙන දේවල් ගැන මෙච්චර කතාකරන්න දේවල් තියෙද්දි හදිසියෙම ඔටුවො ගැන කතාකරන්නෙ ඇයි කියලා මේ තීරුව කියවන අය හිතන්න පුළුවන්. බල්ල, හරකා, කුකුලා, මීයා, අලියා ආදී සත්තු ගැන නිතර කතාකළත්, ඔටුව අපේ කතාබහට කොහොමවත් එන්නෙ නැති සතෙක්. ඔටුව ගැන අපි දන්නෙ ඉස්සර කුමාරෝදය පොතේ කියවලා තිබුණු විදියට කෑම වතුර නැතුව දවස් ගණනක් වුනත් කාන්තාරෙ ඇවිදින්න පුළුවන්, මොල්ලියක් තියෙන සතෙක් හැටියට විතරයි. " ඔටුවා යනු කාන්තාරයේ නැවය " අපි එහෙමයි ගල්ලෑල්ලෙ ලිව්වෙ. ලංකාවෙ ඉන්න කාටත් ඒ කාලෙ ඔටුවෙක් දකින්න පුළුවන් දෙහිවල සත්තු වත්තට ගියොත් විතරයි. හුඟාක් ඉස්සර කොහේද කාන්තාරෙ කින් දක්කගෙන ආපු ඔටුවෙක් සත්තු වත්තෙ හිටියා. දැන් ඌ මැරිලත් ඇති කියලා හිතෙනවා. මැද පෙරදිග ගිය අපේ අය සමහර විට ඔටුවො දකිනවා ඇති. මේ පසුගිය මාසෙ ඉඳලා ලංකාවෙ ජීවත් වන අයට ඔටුව ගැන හිතන්න සිද්ධ වුණා.

වර්තමාන ලංකා රජයෙ පශු සම්පත් (සත්තු පිළිබඳ) බාරව ඉන්න උප ඇමතිවරයා රජයට යෝජනා කරලා තියෙනවා අරාබියෙන් ඔටුවොයි, ඉන්දියාවෙන් පැස්බරුයි ගෙනැත් ලංකාවෙ බෝ කරන්න. ඒ වැඩේට හේතු හැටියට දක්වලා තියෙන්නෙ ලංකාවට එන අරාබි සංචාරකයො ඔටුකිරි බොන්න ආසය, ඒ නිසා ඒ අයට දෙන්න ඔටු කිරි ඕනය, ඒක නිසාය ඔටුවො ගෙනැල්ලා බෝකරන්න අදහස් කරන්නෙ කියලා. පැස්බරු ගෙන්නන්නෙ උගේ බිත්තර කිකිළි බිත්තරේකට වැඩිය ලොකු නිසාත්, කුකුළෙකුට වඩා පැස්බරාගෙ ඇඟේ මස් ගොඩක් තියන නිසාත්ලු. ඕස්ට්‍රේලියන් සංචාරකයො දහ පහළොස් දෙනෙක් ලංකාවට එනවයි කිව්වොත් මේ හාදයො කැන්ගරු ගෙනැල්ලා බෝකරන්න පටන් ගනීවි. මේ තමයි ලංකාවෙ ඇමතිවරුන්ගෙ මොළේ.

මේ කතාව අහපු පරිසරවේදියෙක් ගත්කටටම කිව්වෙ, මේ යක්කුන්ට පිස්සු කියලා. ඔහු කියන්නෙ ස්වභාවයෙන් රටකට හුරුවෙලා ඉන්න සත්ව වර්ගයන්ට අමතරව වෙනත් සත්තු පිටින් ගෙනැත් බෝකිරීම ඒ රටට සහ ජීවත්වන ජනකොට්ඨාශයට හානිකර බවයි. පෙර කාලයේ නැසූ විරූ බොහෝ ලෙඩ රෝග, වසංගත අද විවිධ රටවල බහුලව තියෙනවා. මේ සියල්ල පරිසරය හා ජීවන තත්වයන් වෙනස් කරන්න මිනිහා ගන්න පියවරවල් වල අනිසි විපාක බවයි ඔහු කියන්නෙ.

අනෙක මේ වගේ වැඩ වලින් ලැබෙනවාය කියා සිතා සිටින ආර්ථික වාසි නිකම් හීන මැවීමක් පමණක් බවත් අනාගතයට තවත් බරක් වන ව්‍යාපෘති බවත් ඔහුගේ අදහසයි. මේ ආවාට ගියාට ලකුණු දාගන්න කරණ මෝඩ දේශපාලකයින්ගේ මෝඩ ව්‍යාපෘති බවත් පරිසරවේදියා කිව්වා.

මේ ඔටුවො ගැන කතාව පහුගිය දවස්වල ලංකාවෙ පත්තරවල වෙබ් අඩවි වල නැගලා යන කොට මම ලංකාවෙ අපේ නෑකමට මල්ලි වෙන හාදයෙකුගෙන් මේ ගැන ඇහුවා. ඒ මලයා කිව්වෙ දැනට මේ වැඩේ විකාරයක් වගේ හුඟ දෙනෙකුට පෙනුණට ඒ යෝජනාව ගෙනාපු උප ඇමති කියන දේ තවත් පැත්තකිනුත් හිතලා බැලුවොත් ඒක පොසිටිව් හෙවත් සුබවාදී බවක් පේනවා කියලා. එයා ඒක විස්තර කළේ මේ විදියට.

" වෙළේගෙදර අයියෙ! දැන් බලන්න... ලංකාවෙ හැම තැනම ගස් කපලා වනාන්තර විනාස කරන හින්දා උතුරු නැගෙණහිර විතරක් නෙවෙයි මුළු රටම කාන්තාරයක් වෙන්න කිට්ටුයි. එත කොට ඒ පරිසරයෙ ජීවත් වෙන්න පුළුවන් සත්තු මොකුන්ද? ඔටුවොයි, පැස්බරුයි විතරයි... හරිද...? අනික් කාරණේ... අපිට සවුදි අරාබියෙ වගේ තෙල් හම්බ වෙයි කියලා හිතනවා.... එතකොට ඒ භාරන හැරිල්ලට මේක තනිකරම කාන්තාරයක් වෙනවා.... ඔටුවොත් ගෙනාවම මේක තනිකරම මැද පෙරදිග රටක් වගේම පේන්න පටන් ගන්නවා.... එතකොට අපේ මැදපෙර දිග යන කාන්තාවන්ට සහ පිරිමි අයට මෙහේම රැකියාවල් කරන්න පුළුවන්... මොකද මැද පෙරදිග තියන පරිසරය මෙහේ තියන නිසා.... තව වාසියක් තමයි එතකොට ඔය අරාබිකාරයින්ගෙන් අතවර විඳින්න වෙන්නෙ නැහැ... ගුවන් ගමන් යන්න අවශ්‍ය නැහැ ඉන්නෙ තමන්ගෙ රටේ නිසා...
ඕනම නම් රට ඉඳිගස් ටිකකුත් ලංකාවෙ වවා ගන්න පුළුවන්....
ඔය ඇමතිටම කිව්ව නම්, මං හිතන්නෙ ඒකත් කරලා දේවි..."

♦ ***වෙළේගෙදර රාළ*** **London**